මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2026. 05. 21

ඒ.ඩී. සරත්චන්ද්‍ර මයා
1486/1, බැරෝඩාවත්ත,
කොට්ටාව උතුර,
පන්නිපිටිය.

***පැමිණිලි පාර්ශවය***

ඒ.ඩී.බෙෂාන් ඕෂධ (වයස15)
10 ජී ශ්‍රේණිය
පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය

***වින්දිත පාර්ශවය***

***එදිරිව***

1. සරත් වීරසිංහ මයා
   සිංහල සාහිත්‍යය විෂය භාර ගුරු
   පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය

2. විදුහල්පති
   පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය

3. අධ්‍යක්ෂ
   කලාප අධ්‍යාපන කාර්යාලය
   ශ්‍රී ජයවර්ධනපුර

4. ස්ථානාධිපති
   පොලිස් ස්ථානය,
   කොට්ටාව.

***වගඋත්තර පාර්ශවය***

**පැමිණිලි අංකය :HRC/HO/ 3301/25**

**පැමිණිල්ල**

පැමිණිලිකරු විසින් 2025.09.22 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ 10-ජී ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිය

පුත්‍රයාට, එම විද්‍යාලයේ සිංහල සාහිත්‍යය විෂය උගන්වන සරත් වීරසිංහ ගුරුතුමා විසින් පහර දී ඇති බව සඳහන් කර ඇත. 2025 සැප්තැම්බර් 12 වන දින පාසලේ සිව්වන කාල පරිච්ඡේදයෙන් පසු විවේක කාලයේදී මෙම සිදුවීම වී ඇති අතර, ඊට හේතු වී ඇත්තේ සිංහල සාහිත්‍ය සංග්‍රහයේ එන 'ගංගාවේ සංගීතය' පාඩමට අදාළ කවි 04ක් කටපාඩමින් ඉදිරිපත් කිරීමට දරුවා අපොහොසත් වීමයි. ගුරුවරයා අත තිබූ කොසු මිට දැකීමෙන් ඇති වූ දැඩි බිය සහ තමාට පෙර සිටි සිසුන්ට ද ගුරුවරයා පහර දෙනු ලැබීම නිසා ඇති වූ කම්පනය හේතුවෙන් දරුවාට කවි පැටලී ඇති අතර, එහිදී වගඋත්තර ගුරුවරයා පන්තියේ සියලුම සිසුන් ඉදිරියේ දරුවාගේ අත් දෙක බිත්තියට තබා ගන්නා ලෙස නියෝග කොට, කොසු භාග මිටකින් තට්ටම් ප්‍රදේශයට සහ තුනටිය ප්‍රදේශයට පහරවල් 05ක් එල්ල කර ඇති බව පැමිණිල්ලේ සඳහන් වේ.

එසේම, මෙම පහරදීමෙන් පසුව දරුවා ශාරීරික හා මානසික පීඩාවන්ට ලක්ව ඇති බවත්, 2025.09.12 සහ 13 යන දිනවල හෝමාගම මූලික රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කර අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා (JMO) වෙත ඉදිරිපත් කර ඇත. පසුව 2025.09.18 වන දින දරුවා නැවත පාසල් ගිය ද, එහිදී ඔහු යළිත් අසනීප වීම හේතුවෙන් පන්තිභාර ගුරුතුමිය සහ විදුහල්පතිනිය දැනුවත් කර නැවත වරක් හෝමාගම රෝහලට ඇතුළත් කිරීමට පියා කටයුතු කර ඇති බවයි. 2025.11.19 වන දින විමර්ශන අවස්ථාවේ දී වැඩිදුරටක් කරුණු දක්වමින් පැමිණිලිකරු, 2025.09.22 වන දින කොමිෂන් සභාවේ පැමිණිලි ඉදිරිපත් කිරීමේ කාමරය තුළදී දරුවා අපහසුතාවයට පත්ව දිගා වී සිටි බැවින්, කොමිෂන් සභාවේ මැදිහත්වීම මත 1990 ගිලන්රථ සේවය මඟින් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කළ කර 2025.09.24 වන දින දක්වා නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බව සඳහන් කර ඇත. දරුවා මේ වන විටත් භෞත චිකිත්සක ප්‍රතිකාර මෙන්ම මනෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා අඛණ්ඩව යොමු වෙමින් සිටින බවත් සඳහන් කර ඇත. වයස අවුරුදු 03 දී සිය මව අහිමි වූ දරුවෙකු වන වින්දිතයාට මෙම සිදුවීම දැඩි මානසික කම්පනයක් ඇති කර ඇති බවත්, පන්තියේ සෙසු සිසුන් ඉදිරියේ විවේචනයට ලක්වීම නිසා ඔහු පාසල් යාමට දැඩි බියක් දක්වන බවත් පැමිණිලිකරු සඳහන් කර ඇත.

තව ද, පැමිණිලිකරු විසින් 2025.09.15 වන දින කොට්ටාව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, එහිදී දෙපාර්ශවය අතර ඇති වූ සාකච්ඡාවකින් පසු මෙය සමථයකට පත් වූ බවත් සඳහන් කර ඇත. එහෙත්, දරුවා නැවතත් රෝහල්ගත කිරීමට සිදුවීම නිසා අදාළ සමථය අවලංගු කර 2025.09.20 වන දින නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කරන ලෙස පොලිස් ස්ථානාධිපතිවරයා සහ කාන්තා අංශයේ නිලධාරිනිය දැනුවත් කළ ද, පැමිණිලිකරුගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර ගැනීමට පොලිසිය පියවර ගෙන නොමැති බවට චෝදනා කර ඇත. තවද, 2025.09.25 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කළ ද ඊට නිසි ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් 2025.11.10 වන දින නැවතත් සිහිකැඳවීමේ ලිපියක් ද යොමු කර ඇති බවත් දක්වා ඇත. මේ අතර, මෙම සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ද (SC FRA 248/2025) ගොනු කර ඇති නමුත් එය මෙතෙක් සලකා බැලීමට ලක්කර නොමැති බව ද සඳහන් කර ඇත.

පැමිණිලිකරු විමර්ශන අවස්ථාවේ දී වැඩිදුරටත් කරුණු දක්වමින්, 2025 නොවැම්බර් 04 වන දින විද්‍යාලය තුළ සංවිධානය කරන ලද *"ගුණ දහමින් සුන්දර වන ගුරු සිසු සබැඳියාව"* නමැති වැඩමුළුවක් පැවත් වූ බවත්, විදුහල්පතිනිය සහ කොට්ටාව පොලිස් ස්ථානාධිපති රොෂාන් ද සොයිසා යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු මෙම වැඩමුළුවට අධිකරණ අමාත්‍යාංශයේ නීති උපදේශිකා සුමිත්‍රා සිරිමාන්න මහත්මිය ද සහභාගී වූ බව සඳහන් කර ඇත. එහි දී පැමිණිලිකරු චෝදනා කරන්නේ, අදාළ නීති උපදේශිකාව විසින් *"දරුවන්ට යම් දඬුවමක් කළ විට එයට එරෙහිව පොලිසියේ මෙන්ම අනෙකුත් නීතිමය ආයතන වන මානව හිමිකම් කොමිසම, ළමා ආරක්ෂක*

*අධිකාරිය, මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණිලි නොකරන ලෙස"* දෙමාපියන් හමුවේ ප්‍රකාශ කළ බවයි. මෙම සිදුවීමෙන් පසු පාසල විසින් පවත්වන ලද මෙම වැඩමුළුව වින්දිත දරුවාට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සිදු කළ බාධාවක් මෙන්ම සාපරාධී ක්‍රියාවක් සාධාරණීකරණය කිරීමට ගත් උත්සාහයක් බව පැමිණිලිකරු සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ල තුළින්, දරුවාගේ ආරක්ෂාව, අධ්‍යාපන අයිතිය සහ මානව ගරුත්වය සුරක්ෂිත කරනු පිණිස, අදාළ වගඋත්තරකාර ගුරුවරයාට එරෙහිව විධිමත් විනය හා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොමිෂන් සභාවෙන් සහනය ලෙස අපේක්ෂා කර ඇත.

<u>**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම**</u>

**1. පළමු වගඋත්තර - සරත් වීරසිංහ මයා (සිංහල විෂය භාර ගුරු)**

2025.11.19 වන දින පවත්වන ලද විමර්ශන අවස්ථාවේදී ප්‍රකාශයක් ලබා දෙමින්, වගඋත්තර සරත් වීරසිංහ මහතා සඳහන් කර ඇත්තේ, ඔහු පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ සිංහල විෂය භාර ගුරුවරයා වශයෙන් සේවය කරන බවයි. සිද්ධිය වූ 2025.09.12 වන දින 'ගංගාවේ සංගීතය' කවි පන්තියට අදාළ කවි 04ක් පාඩම් කර ගන්නා ලෙස සිසුන්ට දන්වා තිබූ බවත්, එහිදී සිසුන් 08 දෙනෙකු එම කවි පාඩම් කර නොතිබූ බැවින් ඔවුන්ට ඒ සඳහා තවත් විනාඩි 20ක කාලයක් ලබා දුන් බවත්ය. ඉන් අනතුරුව එම සිසුන්ගෙන් පාඩම් ලබා ගන්නා අවස්ථාවේදී, අසල තිබූ කොසු මිටි කැබැල්ලකින් (කොස්සක කැඩුණු මිටක භාගයකින්) එක් කවියකට එක බැගින් තට්ටම් ප්‍රදේශයට 'තට්ටුවක්' එල්ල කළ බව වගඋත්තරකරු පිළිගන්නා බවයි. එහිදී තමාට දඬුවම් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බවත්, එම ක්‍රියාව හුදෙක් සිසුන්ට කවි පාඩම් කරවීමේ අවශ්‍යතාවය මත සිදු කරන ලද්දක් බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම සිදුවීමෙන් අනතුරුව ඔහු පැමිණිලිකරු සමඟ අවස්ථා කිහිපයකදීම දුරකථනයෙන් සම්බන්ධ වූ බවත්, දරුවා රෝහල්ගත කළ බව දැනගත් වහාම දරුවාගේ සුවදුක් බැලීම සඳහාත්, වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කිරීමට සහාය දැක්වීම සඳහාත් පියවර ගත් බවත්ය . ඔහුගේ දියණිය ද මෙම පන්තියේ ඉගෙනුම ලබන බවත්, මෙම සිදුවීමෙන් පසු දරුවා අපහසුතාවයට පත්වන ආකාරයේ කිසිදු වාචික ප්‍රකාශයක් හෝ හැසිරීමක් පන්ති කාමරය තුළ සිදු නොකළ බවත් සඳහන් කර ඇත. කොට්ටාව පොලිස් ස්ථානයේදී මෙම ගැටලුව සමථයකට පත්ව තිබූ බැවින්, මේ සම්බන්ධයෙන් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග නොගනු ඇතැයි යන අවබෝධයෙන් තමා පසුවූ බව ද ඔහු සඳහන් කර ඇත.

නොවැම්බර් 04 වන දින සංවිධානය කරන ලද වැඩමුළුව පිළිබඳව ද කරුණු දක්වමින්, ඔහු පාසලේ විනය පාලකවරයා ලෙස කටයුතු කරන බවත්, පාසල් සමථකරණ ඒකකය මඟින් සිසුන්ගේ විනය පවත්වාගෙන යාමේ අරමුණින් මෙවැනි වැඩමුළු වරින් වර පවත්වනු ලබන බවත්, මීට පෙර ජූලි මාසයේදී 09 වන ශ්‍රේණියේ සිසුන් සඳහා ද මෙම නිලධාරීන්ගේම සහභාගීත්වයෙන් මෙවැනිම වැඩමුළුවක් පැවැත්වූ බවත් ඔහු සඳහන් කර ඇත.

තව ද , මෙම පැමිණිල්ල මුලින් සමථයකට පත්ව තිබූ බවත්, විද්‍යාලයේ වැඩවසන එක්තරා ස්වාමීන් වහන්සේ නමකගේ බලපෑම මත පැමිණිලිකරු විසින් මෙම පැමිණිල්ල තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යනු ලබන බව තමා විශ්වාස කරන බව ද වගඋත්තර සරත් වීරසිංහ මහතා වැඩිදුරටත් සඳහන් කර ඇත.

**2. දෙවන වගඋත්තරකරු - විදුහල්පති, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය**

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ විදුහල්පතිවරිය විසින් 2025.10.16 දිනැති අංක DVP/PRIN.OFF/01 දරන ලිපිය මගින් මෙම පැමිණිල්ලට අදාළව පහත කරුණු ඉදිරිපත් කර ඇත.

2025 සැප්තැම්බර් 08 වන දින සිට 26 වන දින දක්වා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණ කටයුතුවල නිරතව සිටියදී, 2025 සැප්තැම්බර් 18 වන දින වින්දිත බෙෂාන් ඕෂධ සිසුවාගේ පියා විදුහල්පතිවරිය හමුවීමට පැමිණි බවත්, එහිදී සිංහල විෂය භාර ගුරු සරත් වීරසිංහ මහතා විසින් සිදු කරන ලද පහරදීමක් පිළිබඳව ඔහු කරුණු ඉදිරිපත් කර ඇත. ඒ වන විටත් ඇය මෙම සිදුවීම පිළිබඳව මූලික වශයෙන් දැනුවත්ව සිටි නමුත්, සම්මුඛ පරීක්ෂණ කටයුතු හේතුවෙන් ඒ පිළිබඳ සොයා බැලීමේ වගකීම නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත පවරා තිබූ බවයි. අනතුරුව ඇය විසින් අදාළ ගුරුවරයා, පන්ති භාර ගුරුතුමිය සහ ශ්‍රේණි භාර ගුරුතුමිය සමඟ මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා කළ බව සඳහන් කර ඇත.

ඒ අනුව, 2025 සැප්තැම්බර් 12 වන දින 'ගංගාවේ සංගීතය' කවි පන්තියට අදාළ කවි 04ක් පාඩම් කර නොපැමිණි සිසුන් 08 දෙනෙකුට, ඒ සඳහා අතිරේකව විනාඩි 20ක කාලයක් ලබා දී ඇති බවත්, එම කාලය අවසානයේ ද බෙෂාන් ඕෂධ සිසුවා හට එකදු කවියක්වත් පාඩම් වී නොතිබූ බැවින්, වගඋත්තර ගුරුවරයා පන්තියේ තිබූ කොසු මිටි කැබැල්ලකින් එම සිසුවා ඇතුළු සිසුන් සිව්දෙනෙකුගේ තට්ටම් ප්‍රදේශයට එක් කවියකට එක බැගින් පහරවල් එල්ල කර ඇති බවයි. ගුරුවරයාගේ ප්‍රකාශය අනුව මෙම දඬුවම ලබා දී ඇත්තේ සිසුන්ව පාඩම් වැඩකටයුතු සඳහා පොළඹවා ගැනීමේ අරමුණින් මිස කිසිදු අහිතකර චේතනාවකින් නොවන බව විදුහල්පතිවරිය සඳහන් කර ඇත.

මෙම. සිදුවීමෙන් පසු ගුරුවරයා විසින් සිසුවාගේ පියාට දුරකථනයෙන් අමතා දරුවා පිළිබඳව විමසා ඇති බවත්, එහිදී පියා දරුවාට බාම් වර්ගයක් ආලේප කළ බවත් ගැටලුවක් වුවහොත් දැනුම් දෙන බවත් පවසා බවයි. එහෙත් පසුව දරුවා අසනීප බව පවසා හෝමාගම රෝහලට ඇතුළත් කර ඇති අතර කොට්ටාව පොලිසියේ ද පැමිණිල්ලක් කර ඇති බවයි. සැප්තැම්බර් 18 වන දින පියා විදුහල්පති හමු වූ අවස්ථාවේදී, ඉදිරියේදී දරුවාට ගැටලුවක් නොවන බවට ගුරුවරයා පොරොන්දු වන්නේ නම් නීතිමය පියවර නොගන්නා බවත්, පොලිස් පැමිණිල්ල ඉල්ලා අස්කර ගන්නා බවත් පවසා දෙපාර්ශවය සුහදව සමථයකට පත්ව පිටව ගිය බවත් සඳහන් කර ඇත.

එසේ වුවද, 2025 ඔක්තෝබර් 03 වන දින ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරියෙකු පාසලට පැමිණි අවස්ථාවේදී මෙම ගැටලුව තවදුරටත් පවතින බව ඇය දැනගත් බවත්, ඒ අනුව අදාළ ගුරුවරයාව මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමථකරණ ඒකකයට යොමු කර ප්‍රකාශයක් ලබා දීමට කටයුතු කළ බවයි. පියා අප සමඟ සාකච්ඡා කළ අවස්ථාවේදී ගුරුවරයාගේ ක්‍රියාව හෙළා දකිමින් කතා කළද, ඔහු කිසිදු වෛරයකින් තොරව සුහදව කටයුතු කළ බවත්, බාහිර පාර්ශවයන්ගේ බලපෑම් මත ඔහු මෙම පැමිණිල්ල ඉදිරියට ගෙන යන බව ද සඳහන් කර ඇත.

එම වාර්තාව මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, වින්දිත සිසුවා කිසිදු දිනක විනය විරෝධී ක්‍රියාවක නිරත නොවූ ඉතා සාමකාමී දරුවෙකු බවයි. එසේම වගඋත්තර සරත් වීරසිංහ මහතා විද්‍යාලයේ විනය පාලකවරයා මෙන්ම සමථකරණ ඒකකයේ ප්‍රධානියා ලෙස පාසලට වටිනා මෙහෙවරක් ඉටු කරන, වසර දහයක සේවා කාලයක් සහිත ගුරුවරයෙකු බවයි. විශේෂයෙන්ම පාසල තුළ මත්ද්‍රව්‍ය උවදුර මැඩලීමට ඔහු කළ කැපවීම හේතුවෙන් ඔහුට මරණ තර්ජන පවා එල්ල වී තිබූ බව සඳහන් කර ඇත. විදුහල්පතිවරිය අවසාන වශයෙන් සඳහන් කර ඇත්තේ, විනය පවත්වාගෙන යාමේදී මෙවැනි චෝදනාවලට ලක්වීම සාමාන්‍ය තත්ත්වයක් බවත්, දරුවාට අසාධාරණයක් නොවන

අයුරින් සහ පාසලේ උන්නතිය උදෙසා දෙපාර්ශවයම බුද්ධිමත්ව කටයුතු කරනු ඇතැයි ඇය අපේක්ෂා කරන බවත්ය

එසේම, 2025.11.19 වන දින පවත්වන ලද විමර්ශනයේදී පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ විදුහල්පතිවරිය වෙනුවෙන් පෙනී සිටි වැඩබලන විදුහල්පති වාසල මහතා කරුණු ඉදිරිපත් කරමින්, මෙම සිදුවීම සම්බන්ධයෙන් මුල් අවස්ථාවේදී දෙපාර්ශවය සමථයකට පත්වීම හේතුවෙන් ඒ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය වෙත නිල වශයෙන් දැනුවත් කිරීමක් සිදු නොකළ බවත්. පැමිණිලිකරු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපියට අදාළව විදුහල්පතිවරිය විසින් විධිමත් ලෙස කරුණු දැක්වීමක් සිදු කර ඇති බවත් සඳහන් කර ඇත.

එසේම, පාසලේ ගුරුවරුන්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් දැනුවත් කිරීමට පාසල් පරිපාලනය නිරන්තරයෙන් කටයුතු කර ඇති බව ද ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත. පැමිණිල්ල සම්බන්ධයෙන් ඇති වූ සමථය මත පදනම්ව පාසල් මට්ටමින් ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු නොකළ බවත්, මේ වන විට පැමිණිලිකරු විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරුණු ඉදිරිපත් කර ඇති බව තමා දැනුවත් වී ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**3. තෙවන වගඋත්තරකරු- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ශ්‍රී ජයවර්ධනපුර**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් බප/ජය/අපරි02/මානවහිමිකම් හා 2026.02.18 දිනැති ලිපිය මඟින් සහ 2026.02.19 වන දින පවත්වන ලද විමර්ශනයේදී මෙම පහරදීමේ සිදුවීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් සිදු කරන ලද සොයා බැලීම් සහ විමර්ශන කටයුතු පිළිබඳව පහත කරුණු සඳහන් කර ඇත.

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ජාතික පාසලක් වන බැවින් සහ ඒ සම්බන්ධ විනය හා පරිපාලන විමර්ශන කටයුතු ජාතික පාසල් අධ්‍යක්ෂ මට්ටමින් සිදු විය යුතු බැවින්, මූලික අවස්ථාවේදී කලාප කාර්යාල මට්ටමින් විමර්ශනයක් සිදු කර නොමැති බවත්, විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් 2025.11.04 දිනැති ලිපිය මඟින් සිංහල විෂය භාර සරත් වීරසිංහ ගුරු මහතා විසින් සිසුවෙකුට පහර දීම සහ ඒ හා සම්බන්ධ වත්මන් තත්ත්වය පිළිබඳව ජාතික පාසල් අධ්‍යක්ෂවරයා දැනුවත් කර තිබූ අතර එහි පිටපතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ද යොමු කර තිබූ බව සඳහන් කර ඇත. කෙසේ වුවද, මානව හිමිකම් කොමිෂන් සභාවේ දැනුවත් කිරීම මත කඩිනමින් ක්‍රියාත්මක වූ කලාප අධ්‍යාපන කාර්යාලය, මේ පිළිබඳව සොයා බැලීම සඳහා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ඩී.ඒ.ඩී. මෙත්තානන්ද මහත්මිය සහ විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් විද්‍යාලය වෙත යොමු කර ඇති බවයි.

එම විමර්ශනයේදී ලබා ගත් ප්‍රකාශයන්ට අනුව, 10-ජී පන්තියේ ඉගෙනුම ලබන ඒ.ඩී. බෙෂාන් ඕෂන් ශිෂ්‍යයා හතරවන කාල පරිච්ඡේදයේදී කවි පන්තියක් පාඩම් කර නොතිබීම හේතුවෙන්, විෂය භාර සරත් වීරසිංහ ගුරු මහතා විසින් *"කැඩුණු කොසු මිටකින් පහර දී ඇති බව"* පැමිණිලි පාර්ශවය මෙන්ම පහර කෑමට ලක් වූ සෙසු සිසුන් ද ප්‍රකාශ කර ඇති බව සඳහන් කර ඇත. වගඋත්තර ගුරුවරයා ද කොසු මිටකින් හෝ එවැනි දෙයකින් පහර දුන් බව විමර්ශනයේදී පිළිගෙන ඇති අතර, ඔහු ප්‍රකාශ කර ඇත්තේ දරුවන් අධ්‍යයන කටයුතු සඳහා යොමු කර ගැනීමේ සද්භාවී චේතනාවෙන් තමා එම දඬුවම ලබා දුන් බවයි. පහර කෑමට ලක් වූ සෙසු දරුවන් ගුරුවරයා පිළිබඳව වෛරී හැඟීමකින් පසු නොවන බව ප්‍රකාශ කළ ද, අධ්‍යයන කටයුතු සඳහා පොළඹවා ගැනීමේ අරමුණින් වුවද ගුරුවරයෙකු විසින් දරුවන්ට ශාරීරිකව පහර දීම කිසිසේත්ම අනුමත කළ නොහැකි බව එම වාර්තාව තුළ සඳහන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව, සිසුන් තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතුව වුව ද, කිසිදු ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට ශාරීරික පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබා දීම සපුරා තහනම් වේ. මෙම ගුරුවරයා සම්බන්ධයෙන් මීට පෙර කිසිදු පැමිණිල්ලක් වාර්තා වී නොමැති වුව ද, මෙම සිදුවීම හරහා අදාළ චක්‍රලේඛ උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වන බැවින්, ජාතික පාසල් සම්බන්ධයෙන් විනය තීරණ ලබා දීම කලාප මට්ටමින් සිදු කළ නොහැකි වුව ද, මේ සම්බන්ධ කලාප කාර්යාලයේ නිර්දේශයන් ජාතික පාසල් අධ්‍යක්ෂවරයා වෙත යොමු කිරීමට කටයුතු කළ බව වැඩිදුරටත් දන්වා ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාව (Judicial Medical Report)</u>

අධිකරණ වෛද්‍ය වාර්තා අංක 1284/25 අනුව, 2025.09.12 වන දින හෝමාගම මූලික රෝහල වෙත ඇතුළත් කරන ලද වින්දිත බෙෂාන් ඕෂධ දරුවා, අධිකරණ වෛද්‍ය නිලධාරී ඒ.එම්.ඩී.එන්.කේ. අත්තනායක මහතා විසින් 2025.09.13 වන දින වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර ඇත. එහිදී වින්දිතයා විසින් අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ලබා දෙන ලද කෙටි රෝග ඉතිහාසය පහත පරිදි සටහන් කර ඇත.

***"සරත් වීරසිංහ කියන සිංහල සර් කවි පාඩම් කරේ නෑ කියලා 12.09.2025 වෙනිදා උදේ 10.30ට විතර පන්නිපිටිය ධර්මපාල ඉස්කෝලේ දී කොසු මිටකින් තට්ටමටයි, කොන්දටයි පස් පාරක් විතර ගැහුවා."***

වෛද්‍ය පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ තුවාල (Injuries) පිළිබඳ විස්තරය පහත දැක්වේ.

- **කොන්දේ මැද රේඛාව ආසන්නයේ ඉන ප්‍රදේශයේ දක්නට ලැබුණු සෙන්ටිමීටර 2x3 ප්‍රමාණයේ තැලීම් තුවාලයකි. (2CM*3CM sized contusion at Back of midline between waist line).**

අදාළ වාර්තාවට අනුව, උක්ත බරපතල නොවන (Non-grievous) තුවාලය මොට ආයුධයකින් (Blunt weapon) සිදු වී ඇති බව නිරීක්ෂණය කර ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයාගේ නිගමනය හෙවත් වෛද්‍ය මතය පහත පරිදි දක්වා ඇත.

- **තුවාල රටාව මොට බලයකින් සිදු වූ කම්පනයක් සමඟ අනුකූල වේ. (Injury pattern compatible with blunt force trauma).**

<u>නිරීක්ෂණ -</u>

1. මෙම පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සහ වින්දිත දරුවා පොලිසිය වෙත ලබා දී ඇති ප්‍රකාශ සහ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති රෝගී ඉතිහාසය පිරික්සීමේදී අනාවරණය වන්නේ, 2025.09.12 වන දින පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ 10-ජී පන්තිය තුළදී, හතර වන කාලච්ඡේදය අවසාන වුව ද විවේක කාලය තුළ දී අමතර කාලයක් ලබා දී 'ගංගාවේ සංගීතය' කවි පන්තිය කටපාඩම් කර ගැනීමට අපොහොසත් වීම යන කරුණ පදනම් කරගෙන වගඋත්තර සරත් වීරසිංහ ගුරුතුමා විසින් වින්දිත බෙෂාන් ඕෂධ දරුවාට පසුපසට හැරී බිත්තියට අත් තබා ගන්නා ලෙස නියෝග කර, කැඩුනු කොසු මිටකින් දරුවාගේ කොන්ද සහ තට්ටම් ප්‍රදේශයට පහර දී ඇති බවයි. මෙම පහරදීම හෝමාගම මූලික රෝහලේ අංක MLEF 1284/25 දරන අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් සනාථ වේ.

අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන්ට අනුව, වින්දිත දරුවාගේ කොන්දේ මැද රේඛාව ආසන්නයේ *'සෙන්ටිමීටර 2x3 ප්‍රමාණයේ තැලීම් තුවාලයක්'* පවතින බවත්, එය *'මොට බලයකින් සිදු වූ කම්පනයක් සමඟ අනුකූල වන බවත්'* වෛද්‍ය මතය මඟින් තහවුරු කර ඇත. මෙම විද්‍යාත්මක සාක්ෂිය මඟින් වගඋත්තරකරු විසින් දරුවාට පහර දී ඇති බව නෛතිකව සනාථ වේ.

පළමුවන වගඋත්තර ගුරුවරයා විසින් මෙම ක්‍රියාව හුදෙක් 'තට්ටුවක් දැමීමක්' ලෙස හුවා දක්වමින් එහි බරපතලකම අව ප්‍රමාණ කිරීමට උත්සාහ කර තිබුණ ද, එම ප්‍රහාරයෙන් පසුව දරුවා අවස්ථා තුනකදී රෝහල්ගත කිරීමට සිදු වීම තුළින් වගඋත්තරකරුගේ ප්‍රකාශයේ විශ්වාසනීයත්වය ගිලිහී යන බව පෙනී යයි. විශේෂයෙන්ම, මෙම සිද්ධියට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ඉදිරිපත් කිරීමට පැමිණි අවස්ථාවේදී ද දරුවා නැවතත් අසනීප තත්ත්වයට පත්ව ඇති අතර, එහිදී කොමිෂන් සභාවේ මැදිහත්වීම මත 1990 ගිලන් රථ සේවාව මඟින් කොළඹ ජාතික රෝහල වෙත යොමු කර දින දෙකක් (02) නේවාසිකව ප්‍රතිකාර ලබා දීමට සිදු වීම ද මෙම සිදුවීමේ බරපතලකම පෙන්වයි.

තව ද දරුවා මේ වන විටත් අඛණ්ඩව භෞතචිකිත්සක ප්‍රතිකාර (Physiotherapy) ලබමින් සිටීම තුළින් නිරීක්ෂණය වන්නේ, වගඋත්තරකරු විසින් එල්ල කරන ලද මෙම ප්‍රහාරය දරුවාගේ ශාරීරික අඛණ්ඩතාවයට මෙන්ම ඔහුගේ සමස්ත සෞඛ්‍ය තත්ත්වයට හානියක් සිදු කර ඇති බවයි.

2. දෙවන වගඋත්තර විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කරන ලද අංක DVP/PRIN.OFF/01 දරන වාර්තාවට අනුව, මෙම සිදුවීම සම්බන්ධයෙන් 2025 සැප්තැම්බර් 18 වන දින පැමිණිලිකරු සමඟ විදුහල්පති කාර්යාලයේදී සාකච්ඡාවක් පවත්වා ඇත. එහිදී වින්දිත දරුවාට ඉදිරියේදී අදාළ ගුරුවරයාගෙන් කිසිදු ගැටලුවක් පැන නොනගින බවට වූ පොරොන්දුව මත, කොට්ටාව පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමටත්, නීතිමය පියවර නොගැනීමටත් දෙපාර්ශවය අතර සුහද එකඟතාවයක් ඇති වූ බව ඇය සඳහන් කර ඇත. මෙම සමථයට පත්වීම පදනම් කරගෙන ඒ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය වෙත නිල වශයෙන් දැනුවත් කිරීමක් සිදු නොකළ බව නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් ද විමර්ශනයේදී තහවුරු කරන ලදී.

විදුහල්පතිනිය සිය වාර්තාව මඟින් වගඋත්තරකාර සරත් වීරසිංහ මහතා විද්‍යාලයේ විනය පාලකවරයා මෙන්ම සමථකරණ ඒකකයේ ප්‍රධානියා ලෙස පාසලට වටිනා මෙහෙවරක් ඉටු කරන ගුරුවරයෙකු බව ප්‍රකාශ කරමින් ඔහුව සාධාරණීකරණය කිරීමට උත්සාහ කර ඇත. මෙම පහරදීම හුදෙක් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සිසුන් පෙළඹවීමේ අරමුණින් සිදු කරන ලද්දක් බවත්, ගුරුවරයා සහ සිසුවා අතර කිසිදු පෞද්ගලික ආරවුලක් නොතිබූ බවත් ඇය පෙන්වා දී තිබේ. පොලිසියේදී සිදු වූ එම සමථයෙන් පසු පියා නැවතත් මෙම ප්‍රශ්නය මතු කිරීම බාහිර පාර්ශවයන්ගේ බලපෑම මත සිදු වූවක් බවත්, විනය පවත්වාගෙන යාමේදී මෙවැනි චෝදනාවලට ලක්වීම සාමාන්‍ය තත්ත්වයක් බවත් පවසමින් පාසල් පරිපාලනය විසින් මෙම පහරදීම සාමාන්‍යකරණය කිරීමට උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සිදු වූ මෙවැනි සිදුවීමක් හුදු පාසල් මට්ටමේ සමථයකින් අවසන් කිරීමට උත්සාහ කිරීම පරිපාලනමය අතපසුවීමක් බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

3. පැමිණිලි පාර්ශවය, කොට්ටාව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය හමුවේ 2025.09.17 වන දින (තොරතුරු පොතේ පිටුව 165, ඡේදය 86) එළඹුණු මූලික සමථය පිළිගනු ලැබුවද, වින්දිත දරුවා 18 වන දින නැවත පාසල් යාමෙන් අනතුරුව යළිත් අසාධ්‍ය තත්ත්වයට පත්ව රෝහල්ගත වීමට සිදු වීමත් සමඟ එම සමථයේ පදනම වෙනස් වී ඇති බව නිරීක්ෂණය වේ. දරුවාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම සහ ඔහුගේ අනාගතය පිළිබඳව ඇති වූ සාධාරණ බිය හේතුවෙන්, මෙම

පැමිණිල්ල සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කළ යුතු බව පැමිණිලිකරු විසින් පොලිස් ස්ථානය වෙත අවධාරණය කර ඇත. එසේ වුව ද, වගඋත්තර පොලිස් නිලධාරීන් ඒ පිළිබඳව කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ පැමිණිලිකරුගේ වැඩිදුර ප්‍රකාශයක් සටහන් කර ගැනීමට කටයුතු කර නොමැති බව පෙනී යයි. පොලිසිය සිය රාජකාරිමය වගකීම පැහැර හරින ලද එවැනි පසුබිමක, පැමිණිලිකරු සාධාරණයක් අපේක්ෂාවෙන් වෙනත් නීතිමය ආයතන වෙත යොමු වීමට තීරණය කර ඇති බව නිරීක්ෂණය වේ.

4. මෙම පැමිණිල්ලේ සිව්වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති කොට්ටාව පොලිස් ස්ථානාධිපතිවරයා වෙතින් පැමිණිල්ලට අදාළ සවිස්තරාත්මක වාර්තාවක් කැඳවමින් 2025.12.09 දිනැතිව කොමිෂන් සභාව විසින් ලිඛිතව කළ දැනුම්දීම සහ 2026.02.19 වන දින පවත්වන ලද විමර්ශනයේදී කළ වාචික නියෝගයන් නොසලකා හරිමින් අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමට ස්ථානාධිපතිවරයා දිගින් දිගටම අපොහොසත් වී ඇත. එසේ වුව ද, වගඋත්තරකාර ගුරුවරයා හට කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පොලිස් තොරතුරු සටහන්වල සහතික කරන ලද සහ යතුරුලියනය කරන ලද පිටපත් 2025.11.07 දිනැතිව ලබා දීමට ස්ථානාධිපතිවරයා කටයුතු කර ඇති බව වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කළ ලේඛන මඟින් තහවුරු වේ. මෙලෙස වගඋත්තරකරු වෙත අවශ්‍ය සියලු ලිපි ලේඛන සපයා තිබියදීත්, මෙම කොමිෂන් සභාව වෙත නිල වාර්තාවක් ඉදිරිපත් කිරීම මගහැරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 (2) (3) යටතේ කරුණු ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත.

විශේෂයෙන්ම, වගඋත්තර පාර්ශවය ඉදිරිපත් කරන ලද එම පොලිස් තොරතුරු උද්ධෘත පිරික්සීමේදී 2025.09.15 වන දින අංක 155/75 දරන සටහන යටතේ පොලිස් ස්ථානය වෙත මෙම පැමිණිල්ල ලැබී තිබියදීත්, වගඋත්තරකරුගේ ප්‍රකාශය සටහන් කර ඇත්තේ පැමිණිල්ල 'සමථයකට පත් කළ බව' සඳහන් වන 2025.09.17 දිනැති 166/86 සටහනට ද පසුව එන 166/87 සටහන මඟින් බව නිරීක්ෂණය වේ. මෙම සිදුවීම් පෙළගැස්ම තුළින් පැහැදිලි වන්නේ, ස්ථානාධිපතිවරයා විසින් විධිමත් අපරාධ විමර්ශන පටිපාටියක් අනුගමනය කරනු වෙනුවට, වගඋත්තරකාර ගුරුවරයා ආරක්ෂා කිරීමේ අරමුණින් හුදු 'සමථයකට' පමණක් ප්‍රමුඛතාවය ලබා දී ඇති බවයි. ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ ළමයින් කෲරත්වයට පත්කිරීම 308 (අ) වරද යටතේ හෝ 1994 අංක 22 දරන වධහිංසා පැමිණවීමට එරෙහි සම්මුති පනත යටතේ විමර්ශනය කළ යුතු ක්‍රියාවක් මෙලෙස යටපත් කිරීමට හෝ වසන් කිරීමට ස්ථානාධිපතිවරයා උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ.

5. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව, 2025 නොවැම්බර් 04 වන දින විද්‍යාලය තුළ සංවිධානය කරන ලද වැඩමුළුවේදී, අධිකරණ අමාත්‍යාංශයේ නීති උපදේශිකාව සහ කොට්ටාව පොලිස් ස්ථානාධිපතිවරයා සහභාගී කරවා ගනිමින්, 'දරුවන්ට දඬුවම් කළ විට මානව හිමිකම් කොමිෂන් සභාව හෝ පොලිසිය වෙත පැමිණිලි නොකරන ලෙස' දෙමාපියන් දැනුවත් කර ඇති බවට වන චෝදනාව අවධානයට ලක් ව ඇත. මෙම වැඩසටහනට අදාළ සියලුම ලිඛිත ලේඛන සහ වීඩියෝ දර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස 2026.02.19 වන දින පවත්වන ලද විමර්ශනයේදී වගඋත්තර පාර්ශවයට දැනුම් දී තිබුණ ද, එම ලේඛන ඉදිරිපත් කිරීමට ඔවුන් මෙතෙක් අපොහොසත් වීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 (2) (3) යටතේ කරුණු ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත.

විමර්ශන අවස්ථාවේදී අදාළ වැඩසටහනට අදාළ වාර්තා සහ වීඩියෝ දර්ශන තමන් සතුව පවතින බව වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර සිටියද, ඒවා ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම තුළින් එම වැඩසටහනේ අන්තර්ගතය පිළිබඳව පූර්ණ විනිවිදභාවයකින් යුතුව කරුණු තහවුරු කර ගැනීමට නොහැකි වී ඇත. පාසල් පරිසරය තුළදී යම් අගතියකට පත් වූ දරුවෙකුගේ අයිතිවාසිකම් වෙනුවෙන්

නීත්‍යානුකූල මාවතකට යොමු වීම පිළිබඳව මෙවැනි වැඩසටහන් හරහා යම් ධනාත්මක නොවන අර්ථකථනයන් ලබා දීම, වින්දිත දරුවා සහ දෙමාපියන් තවදුරටත් මානසික අපහසුතාවයකට පත් කිරීමට හේතු විය හැකි බව පෙනී යයි. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පිළිබඳව සහ මූලික අයිතිවාසිකම් සුරැකීම පිළිබඳව පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේදී, ආයතනික මට්ටමින් වගකීම් සහගත සහ සංවේදී ප්‍රවේශයක් අනුගමනය කිරීමේ ඉතා වැදගත් බව නිරීක්ෂණය වේ.

6. මෙම පහරදීමේ සිදුවීම හුදෙක් ශාරීරික වේදනාවකට පමණක් සීමා වූවක් නොවේ, එය දරුවෙකුගේ මනසට සහ පෞරුෂයට සිදු කරනු ලබන බරපතල මෙන්ම අතිශය සංවේදී හානියකි. නීතිමය ක්‍රියාමාර්ග හරහා යුක්තිය පසිඳලීමට හෝ මූල්‍යමය වන්දි ලබා දීමට ගතවන කාලය තුළ වින්දිත දරුවා අත්විඳින මානසික කම්පනය කිසිදු වන්දියකින් පියවිය නොහැකි තරම් ප්‍රබල වේ. ශාරීරික තුවාල සුව වුව ද, තම පන්ති කාමරය තුළ සමවයස් සිසුන් ඉදිරියේ විඳීමට සිදු වූ මෙම අවමානය සහ පීඩාව දරුවාගේ මනස තුළ නොමැකෙන කැළලක් ඇති කරන බවත්, එය ඔහුගේ අනාගත පෞරුෂ වර්ධනයට බාධාවක් විය හැකිය.

යහපත් වැඩිහිටියෙකු නිර්මාණය වීමේ මූලික පදනම සැකසෙන්නේ නිරෝගී සහ සුරක්ෂිත ළමා අවධියක් තුළිනි. දරුවෙකුගේ මනසට මෙවැනි හිංසනයක් හරහා ඇති කරනු ලබන බලපෑම කිසිදු දිනක ආපසු හැරවිය නොහැකි අතර, එය එම දරුවාගේ සමස්ත ජීවිතය කෙරෙහිම අහිතකර ලෙස බලපෑ හැකිය. එබැවින්, පාසල් පරිසරයක් තුළ සිදු වන්නා වූ මෙවැනි ක්‍රියාවන්හි බැරෑරුම්කම කිසිසේත් අවතක්සේරු කළ නොහැකි බවත්, දරුවෙකුගේ ආත්ම අභිමානය සහ මනෝ-සමාජීය යහපැවැත්ම උල්ලංඝනය වීම යනු සමස්ත සමාජයේම අනාගතය කෙරෙහි එල්ල වන තර්ජනයකි. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට යොමු වීම දිරිගැන්වීම වෙනුවට, එය වළක්වාලන ආකාරයේ මතවාදයන් පාසල් පද්ධතිය තුළ පතුරුවා හැරීම ද මෙම බරපතල තත්ත්වය තවදුරටත් සංකීර්ණ කිරීමට හේතු වන බව නිරීක්ෂණය වේ.

7. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308 (අ) වගන්තිය ප්‍රකාරව ළමයින් කෲරත්වයට භාජනය කිරීම නීති විරෝධී සහ දණ්ඩනීය වරදක් වන බවත්, 311 (ඈ) වගන්තිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තියේ (UNCRC) පළමුවන වගන්තිය මඟින් වයස අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයෙකුම "ළමයෙකු" ලෙස අර්ථ දක්වා ඇති අතර, ඔවුන් වෙත එම ප්‍රඥප්තියේ සඳහන් සියලුම මූලික අයිතිවාසිකම් හිමි විය යුතු බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව, වින්දිත බෙෂාන් ඕෂධ දරුවා වයස අවුරුදු 15ක පසුවන්නෙකු බැවින්, ඔහු ඉහත සඳහන් සියලුම දේශීය හා ජාත්‍යන්තර නෛතික ආරක්ෂාවන් සහ හිමිකම් ලැබීමට පූර්ණ අයිතිය සහිත දරුවෙකු වේ.

8. ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (UNCRC) 28(2) වගන්තිය මඟින්, පාසල් තුළ විනය පාලනය කිරීමේ ක්‍රියාවලිය සෑම විටම දරුවාගේ ගෞරවයට හා අභිමානයට අනුකූල වන පරිදි සිදු කළ යුතු බව අවධාරණය කර ඇත. මෙම ජාත්‍යන්තර මූලධර්මය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 12/2016 දරන චක්‍රලේඛයේ 2.2 උප වගන්තිය මඟින් ද දේශීය නෛතික රාමුව තුළ පිළිගෙන තහවුරු කර තිබේ. ඒ අනුව, ළමයින්ට එරෙහිව සිදු කෙරෙන කිසිදු ආකාරයක ශාරීරික හෝ මානසික හිංසනයක් වළක්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් පනවා ඇති ප්‍රමිතීන්ගෙන් බැහැර වීමට කිසිදු ව්‍යතිරේකී තත්ත්වයකට ඉඩ නොලැබෙන බවත්, එම ආරක්ෂාව සම්මුතියේ 19 වන වගන්තිය මඟින් තවදුරටත් ප්‍රතිඥා දී ඇත. මෙවැනි පැහැදිලි නෛතික පසුබිමක් පවතින පසුබිමක, මෙම විමර්ශනයේදී ඉදිරිපත් වූ සාක්ෂි, වෛද්‍ය වාර්තා සහ සිද්ධිමය සාධක මඟින් පැහැදිලිවම අනාවරණය වන්නේ පළමුවන වගඋත්තරකාර සරත් වීරසිංහ යන අය විසින් වින්දිත දරුවාට පහරදීමක් සිදු කර ඇති බවයි.

9. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 2012/37 දරන චක්‍රලේඛය මඟින් ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම් සහ වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව පැහැදිලි මඟපෙන්වීම් ලබා දී ඇත. මෙම චක්‍රලේඛයේ මූලික හරය වන්නේ ගුරුවරුන් පාසල තුළදී ශිෂ්‍යයන්ගේ 'ස්ථානීය දෙමාපියන්' (In Loco Parentis) නම් වූ නීතිමය සංකල්පයට අනුව කටයුතු කිරීමට බැඳී සිටින බවයි. ඒ අනුව, සෑම දරුවෙකුගේම පෞරුෂයේ පරිපූර්ණ සංවර්ධනයට දායක වීමත්, ශිෂ්‍යයන්ගේ සුබසිද්ධියට හේතුවන අයුරින් ඔවුන්ගේ ගරුත්වය ආරක්ෂා කරමින් කටයුතු කිරීමත් සෑම ගුරුවරයෙකුගේම සදාචාරාත්මක වගකීමක් බව මෙහිදී අවධාරණය කර ඇත. එබැවින්, දරුවෙකුගේ ආත්ම අභිමානයට හානි වන අයුරින් කටයුතු කිරීම හෝ ශාරීරික පීඩාවන්ට ලක් කිරීම මෙම වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝනය කිරීමකි.

එමෙන්ම, පාසල් පද්ධතිය තුළ විනය පාලනය කිරීමේ මුවාවෙන් සිදුවන ශාරීරික දඬුවම් පැමිණවීම සපුරා තහනම් කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අංක 12/2016 දරන චක්‍රලේඛය නිකුත් කර තිබේ. මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව, සිසුවෙකු තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන්, සද්භාවයෙන් යුතුව වුව ද, කිසිදු ශිෂ්‍යයෙකුට ශාරීරික හෝ මානසික පීඩාවක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් ගුරුවරුන් සහ පරිපාලන නිලධාරීන් වැළකී සිටිය යුතුය. ශාරීරික දඬුවම් පැමිණවීම තුළින් දරුවා තුළ ඇති කරන බිය, කම්පනය සහ මනෝ-සමාජීය පසුබෑම ඔවුන්ගේ අධ්‍යාපන අයිතියට එල්ල වන සෘජු බාධාවක් ලෙස මෙමඟින් හඳුනාගෙන ඇති අතර, විනය පාලනය සඳහා ශාරීරික දඬුවම් වෙනුවට උපදේශනය සහ ධනාත්මක විනය කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කරන ලෙස විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට උපදෙස් ලබා දී ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවා ඇති ඉහත සඳහන් සියලුම විධිවිධාන සහ මාර්ගෝපදේශ මෙලෙස පැහැදිලිව පවතිද්දී, වගඋත්තරකාර ගුරුවරයා විසින් 'කැඩුණු කොසු මිටක්' වැනි මොට ආයුධයක් භාවිතා කරමින්, පන්ති කාමරය තුළ සෙසු සිසුන් ඉදිරියේ වින්දිත දරුවාට පහර දීම මඟින් අදාළ චක්‍රලේඛයන්හි අන්තර්ගත නියෝගයන් සෘජුවම උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

10. ශාරීරික දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණය ලබා දී ඇති තීන්දු පිරික්සීමේදී, ***<u>ඊ.එම්. ලලිත බණ්ඩාර සහ තවත් අය එදිරිව රම්‍යා ද සිල්වා සහ තවත් අය [SC/FR 461/2012</u>***] දරන නඩු තීන්දුව සුවිශේෂී වැදගත්කමක් ගනී. කුරුණෑගල ශ්‍රී ජෝන් කොතලාවල මහා විද්‍යාලයේ 11 ශ්‍රේණියේ සිසුවෙකුට සිය පන්ති භාර ගුරුවරිය විසින් සිදු කරන ලද පහරදීමක් හේතුවෙන් ඔහුගේ කන් බෙරය සිදුරු වීම (Perforation of ear drum) සම්බන්ධයෙන් මෙම නඩුව පවරා තිබුණි. ගුරුවරයෙකු විසින් විනය පාලනය කිරීමේ මුවාවෙන් සිසුවෙකුට එරෙහිව සිදු කරනු ලබන මෙවැනි ප්‍රචණ්ඩකාරී පහරදීම්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති 'කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය' යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණය අවධාරණය කර ඇත.

විනය පාලනය හෝ වෙනත් කිසිදු හේතුවක් මත සිසුවෙකුට ශාරීරික දඬුවම් පැමිණවීම නීතියෙන් අනුමත කළ නොහැකි බවත්, එවැනි ක්‍රියාකලාපයන් මඟින් දරුවාගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට බරපතල අහිතකර බලපෑම් ඇති වන බවත් අධිකරණය මෙහිදී පෙන්වා දී ඇත. මෙම තීන්දුව හරහා ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මහතා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නියෝග කළේ, සියලුම ගුරුවරුන් සහ පරිපාලන නිලධාරීන් වෙත ශාරීරික දඬුවම් පිළිබඳ වධහිංසාව ශූන්‍ය කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රකාශ කරමින් නව චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසයි. ඒ අනුව වර්තමානයේ ක්‍රියාත්මක වන අංක 11/2026 දරන චක්‍රලේඛය මෙම නඩු තීන්දුවේ ප්‍රතිඵලයකි.

***හේවා මද්දුමගේ කරුණාපාල එදිරිව ඒ. ජයන්ත ප්‍රේම කුමාර සිරිවර්ධන [SC FR /97/2017]*** දරන නඩු තීන්දුව මෙහිදී සුවිශේෂී වේ. එම නඩුවේදී, පාසල් විනය භාර ගුරුවරයෙකු විසින් ශිෂ්‍යයෙකුගේ වම් කනට සිදු කරන ලද පහරදීමක් හේතුවෙන් එම දරුවාගේ ශ්‍රවණ ශක්තිය ස්ථිරවම අහිමි වී තිබූ අතර, එකී ක්‍රියාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී. එම නඩු තීන්දුව මඟින් අධිකරණය වැඩිදුරටත් අවධාරණය කර සිටියේ, ශාරීරික දඬුවම් පැමිණවීම කිසිදු අයුරකින් "විනය පාලනය කිරීමේ ක්‍රියාවලියක්" ලෙස පිළිගත නොහැකි බවයි. එවැනි අමානුෂික විනය පරිචයන් අධ්‍යාපන පද්ධතියෙන් මුලිනුපුටා දැමීම රජය සතු සෘජු වගකීමක් බව ද එහිදී පෙන්වා දෙන ලදී. ඒ අනුව, දරුවෙකුට එරෙහිව සිදු කෙරෙන ශාරීරික හිංසනය පමණක් නොව, එමඟින් දරුවා වෙත ඇති කරනු ලබන මානසික හානිය ද නීතිය හමුවේ දැඩිව සලකා බැලිය යුතු නීති විරෝධී ක්‍රියාවක් බව මෙම පූර්වාදර්ශය මඟින් තහවුරු කර ඇත. මෙම නෛතික ස්ථාවරය වර්තමාන පැමිණිල්ලේ සඳහන් වින්දිත දරුවාට සිදු වූ අගතිය සම්බන්ධයෙන් ද සෘජුවම අදාළ වේ.

තවද, ***සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව (1989) 2 SLR 393*** යන නඩුවේදී අධිකරණය විසින් ලබා දී ඇති තීන්දුවට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති ආරක්ෂාව හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වයට පමණක් සීමා නොවේ. එම ව්‍යවස්ථාවේ විෂය පථය පුද්ගලයෙකුගේ ආත්මය, මානසිකත්වය සහ අභ්‍යන්තර පෞරුෂයට එල්ල වන බලපෑම් ද ආවරණය වන පරිදි පුළුල්ව අර්ථ දක්වා ඇත. ඒ අනුව, පුද්ගලයෙකු වෙත එල්ල වන වාචික හෝ මානසික පීඩාවද 11 වන වගන්තිය යටතේ වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙස සැලකිය හැකි බව තහවුරු වේ.

එමෙන්ම, ***විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත (SC FR App No. 677/2012)*** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දරුවන්ට සිදුවන හිංසනයන් සම්බන්ධයෙන් සුවිශේෂී නිරීක්ෂණයක් සිදු කර ඇත. එහිදී දක්වා ඇත්තේ, සාමාන්‍යයෙන් 11 වන වගන්තිය උල්ලංඝනය වීමක් ලෙස සැලකීමට "බරපතල මට්ටමේ හිංසනයක්" පැවතිය යුතු වුවද, වැඩිහිටියෙකුට අදාළ වන එම නිර්ණායකය සෑම විටම බාලවයස්කරුවෙකුගේ මානසික තත්ත්වය හා සමපාත නොවන බවයි. එහිදී අධිකරණය වැඩිදුරටත් අවධාරණය කළේ මෙසේය.

*"...එබැවින්, බාලවයස්කරුවෙකු විසින් අවමන් සහගත සැලකීම් පිළිබඳව පැමිණිලි කරන අවස්ථාවක, 'ඉහළ භාරකරු' ලෙස කටයුතු කරන අධිකරණය, අදාළ ක්‍රියාව ඉහත කී 'බරපතල හිංසන මට්ටම' සපුරා නොමැති බව පවසමින් එම පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට හදිසි නොවිය යුතුය. ඒ වෙනුවට, චෝදනා එල්ල වී ඇති ක්‍රියාව මඟින් අදාළ දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට සිදු වී ඇති බලපෑම පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය."*

මීට අමතරව, ***පරාක්‍රමගේ ඩග්ලස් බණ්ඩාර එදිරිව එස්. වික්‍රමසිංහ සහ තවත් අය (SC Application No. 190/94)*** නඩු තීන්දුව ද මෙම සිදුවීමට සෘජුවම අදාළ වේ. එහිදී පාසල් ශිෂ්‍යයෙකුට ගුරුවරුන් විසින් පහර දීම සහ "තමුසේ" වැනි වචන භාවිත කරමින් ප්‍රසිද්ධියේ අපහාස කිරීම හේතුවෙන් එම දරුවා බරපතල මානසික බිඳවැටීමකට ලක්ව මාසයක් පුරා මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා තිබුණි. එහිදී අධිකරණය තීරණය කළේ ගුරුවරුන් විනය පාලනය කිරීමට උත්සාහ කරන අවස්ථාවන්හිදී ක්‍රියා කරන්නේ රජයේ නිල බලය යටතේ බැවින්, ඔවුන් සිදු කරන මානසික හා ශාරීරික හිංසනයන් සඳහා රජය සහ අදාළ නිලධාරීන් වගකීමට බැඳී සිටින බවයි.

ඉහත සඳහන් සියලුම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවලට අනුව, මෙම සිදුවීමේදී ද වින්දිත දරුවා වෙත එල්ල කරන ලද ශාරීරික පහරදීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ගැනෙන "කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක්" ලෙස සැලකිය හැකි බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

ඒ අනුව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂිමය කරුණු සහ නිරීක්ෂණ, වෛද්‍ය වාර්තා සමස්තයක් ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පහත නිගමනයන්ට එළඹෙන ලදී.

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ (CRC) පාර්ශවකරුවෙකු ලෙස දරුවන්ට වධහිංසාවෙන් තොර ආරක්ෂිත අධ්‍යාපන පරිසරයක් සහතික කිරීමට බැඳී සිටියි. එමෙන්ම, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016, 2012/37 සහ 11/2026 දරන චක්‍රලේඛ මඟින් පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීම සපුරා තහනම් කර ඇත. විශේෂයෙන්ම 11/2026 චක්‍රලේඛය මඟින් උපුටා දක්වන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 461/2012 හි තීන්දුව ප්‍රකාරව, දඬුවම් කිරීමේ ක්‍රමයක් ලෙස කිසිඳු ශාරීරික හෝ මානසික හානියක් සිදු නොකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වධහිංසාව ශුන්‍ය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය.

මෙවැනි පසුබිමක, පළමුවන වගඋත්තරකාර සරත් වීරසිංහ ගුරුතුමා විසින් කවි කටපාඩම් කිරීමට අපොහොසත් වීම යන කරුණ පදනම් කරගෙන, දඬුවම් කිරීමේ අරමුණින් කැඩුණු කොසු මිටකින් වින්දිත දරුවාට පහර දී ඇති බව විමර්ශනයේදී සහ අධිකරණ වෛද්‍ය වාර්තාව (MLEF 1284/25) මඟින් සනාථ වේ. ඒ අනුව, පළමුවන වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය මඟින් සහතික කර ඇති "කිසිම තැනැත්තකු වධහිංසාවට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමි.

දෙවන වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් මෙම පහරදීමේ සිදුවීම පිළිබඳව කලාප අධ්‍යාපන බලධාරීන් කරුණු වාර්තා කිරීමට කඩිනමින් පියවර නොගැනීම, පවතින චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාළ ගුරුවරයා සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ. සිදු වූ හිංසනය විධිමත් විමර්ශනයකට ලක් කරනවා වෙනුවට, එය පාසල් මට්ටමින් පමණක් සමථයකට පත් කිරීමට උත්සාහ කිරීම තුළින් දරුවාගේ උපරිම යහපතට වඩා පාසලේ කීර්තිනාමය ආරක්ෂා කිරීම කෙරෙහි ඇය වැඩි අවධානයක් යොමු කර ඇති බව පෙනී යයි. විදුහල්පතිවරිය සිය අධීක්ෂණ වගකීම ඉටු කිරීමේදී දැක්වූ මෙම මන්දගාමී ස්වභාවය සහ සිද්ධිය පිළිබඳව දක්වන ලද අඩු සංවේදීතාව හේතුවෙන් වින්දිත දරුවාට නීතියෙන් හිමි විය යුතු සමාන ආරක්ෂාව සහ රැකවරණය ගිලිහී ගොස් ඇත. ඒ අනුව, දෙවන වගඋත්තරකාර විදුහල්පතිතුමිය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මඟින් සහතික කර ඇති "නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

තෙවන වගඋත්තරකාර ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විධිමත් මූලික විමර්ශනයක් පවත්වා ඒ හා අදාළ තොරතුරු සහ වාර්තාවන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, තෙවන වගඋත්තරකාර පාර්ශවය සිය රාජකාරිමය වගකීම් නිසි පරිදි ඉටුකර ඇති බව පෙනී යන බැවින්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවට කරුණු අනාවරණය නොවන බව නිගමනය කරමු.

සිව්වන වගඋත්තරකාර කොට්ටාව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් මෙම පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් අපරාධ විමර්ශනයක් පවත්වා නීතිය ක්‍රියාත්මක කරනු වෙනුවට, එය හුදු

'සමථයකට' පමණක් සීමා කිරීමට උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, පහරදීමට ලක්වූ දරුවාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහී නැවත රෝහල්ගත කිරීමට සිදු වීම හේතුවෙන්, පැමිණිලිකරු විසින් පෙර පැවති සමථය ප්‍රතික්ෂේප කර නිත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කරන ලෙස 2025.09.20 වන දින ඉල්ලා සිටියදීත්, ඒ පිළිබඳව වින්දිත පාර්ශවයේ නව ප්‍රකාශ සටහන් කර ගැනීමට පියවර නොගෙන පැරණි සමථය ප්‍රකාරවම කටයුතු කිරීමට ස්ථානාධිපතිවරයා පෙළඹී ඇත.

වධහිංසා පැමිණවීමට එරෙහි සම්මුති පනත යටතේ විමර්ශනය විය යුතු සාපරාධී ස්වභාවයක් සහිත කාරණයක් මෙලෙස පෞද්ගලික මට්ටමින් සමථයකට පත් කිරීමට උත්සාහ කිරීම සහ ලේඛණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකිරීම තුළින් වින්දිතයාට හිමිවිය යුතු නීතියේ සාධාරණ රැකවරණය සහ ආරක්ෂාව ඔහු විසින් අහිමි කර ඇති බව පෙනී යයි. ඒ අනුව, සිව්වන වගඋත්තරකාර කොට්ටාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් සිය නිල වගකීම පැහැර හැරීම මඟින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියෙන් සහතික කර ඇති "නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

ඒ අනුව, පහත නිර්දේශ ඉදිරිපත් කරයි.

1. පළමුවන වගඋත්තර සරත් වීරසිංහ රුපියල් **25,000/-** ක මුදලක් වින්දිත දරුවා වෙත ගෙවිය යුතුය.

2. පළමුවන වගඋත්තර සරත් වීරසිංහ ගුරුවරයා විසින් සිදු කරන ලද මෙම පහරදීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පරීක්ෂණයක් සිදුකර සුදුසු පියවර ගත යුතුය.

3. දෙවන වගඋත්තර විදුහල්පතිනිය විසින් මෙම සිදුවෙමේ සිය වගකීම නිසි පරිදි ඉටු කිරීමට සහ දරුවාගේ උපරිම යහපත තහවුරු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විමර්ශනයක් පවත්වා සුදුසු පියවර ගත යුතුය.

4. මෙම පහරදීම සම්බන්ධයෙන් 1994 අංක 22 දරන වධහිංසා පනත යටතේ, පළමුවන වගඋත්තරකරුට එරෙහිව නඩු පැවරීමට පියවර ගැනීමටත් විමර්ශන පැහැර හැරීම සහ පක්ෂපාතීව කටයුතු කිරීම සම්බන්ධයෙන් සිව්වන වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමටත් පොලිස්පතිවරයා කටයුතු කළ යුතුය.

5. පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලිය ඉවත් කිරීම සහ සිසුන්ගේ ගරුත්වය සුරක්ෂිත කිරීම උදෙසා, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අංක 12/2016, 2012/37 සහ 11/2026 යන චක්‍රලේඛයන්හි අන්තර්ගතය සහ විධිවිධාන පිළිබඳව පාසලේ සමස්ත ගුරු මණ්ඩලය, පරිපාලන නිලධාරීන් මෙන්ම සිසුන් ද දැනුවත් කිරීමේ විධිමත් වැඩසටහන් මාලාවක් කලාප අධ්‍යාපන කාර්යාලයේ මැදිහත්වීමෙන් පැවැත්විය යුතුය.

2026.07.08 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත 1. අමාත්‍යතුමිය - කරුණු දැන ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

2. ලේකම් - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

3. පොලිස්පතිතුමා - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.